# කෞටිල්‍යයන්ට යට නොවෙමු

ඉන්දියාව අපේ අසල්වැසියාය. එසේ කීම ගැන සමහරවිට ඉන්දියානුවන් කෝපවීමට ඉඩ ඇත. දිළින්දකු තමා බලවතකුගේ අසල්වැසියා යැයි කී විට බලවතාට ඒ මදිකමක් වීමට හැකිය. බලවතා අසල්වැසියා යැයි කීමෙහිම බලවතා හා දිළින්දා අතර යම් සමානත්වයක් පිළිබඳ හැඟීමක්ද වෙයි. බලවත්තු එවැනි ප්‍රකාශවලට අකමැති වෙති. කෙසේ වෙතත් බලවතකු අපේ අසල්වැසියා වීම ම අපට ප්‍රශ්නයකි. අද අපට අපේ ස්වෛරීභාවය රැකගැනීමෙහිලා ඉන්දියාව ප්‍රධාන බාධකයක් වී ඇත. අද පමණක් නොව අතීතයේදීද ඒ එසේම විය. අතීතයේ ඉන්දියාවක් යනුවෙන් රටක් නො තිබුණු බව සැබෑය. එහෙත් අද ඉන්දියාව සමන්විත වන ඇතැම් ප්‍රදේශවලින් අපට අතීතයේදී විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවිය. මෙරට රජකළ බොහෝ රජවරු එදා දඹදිව ගැන අවබෝධයක් ඇතිව ක්‍රියා කළහ. එහෙත් ඇතැම් රජවරු එදා ද අපේ ප්‍රශ්නවලට දඹදිවද මැදිහත්කරගත්හ. ඒ නිසාම අපේ ප්‍රශ්න තව තවත් උග්‍ර විය. ඉන්දියාව, ඉන්දියාවක් ලෙස තනි රටක් බවට පත්වූයේ බ්‍රිතාන්‍යයින්ගේ පැමිණීමෙන් පසුවය. ඉන් පෙර එහි තිබු ප්‍රදේශවලින්, භූගෝලීය පිහිටීම නිසාම, අපට වඩාත්ම ප්‍රශ්න ඇති වූයේ දකුණේ පිහිටි ද්‍රවිඩ යැයි කියැවෙන රාජ්‍යවලින්ය. එදා ඒ රාජ්‍ය චේර, පාණ්ඩ්‍ය, සොලී, විජයනගර් ආදී වශයෙන් හැඳින්විණි. අද ආන්ද්‍ර ප්‍රදේශය නමින් හැඳින්වෙන ප්‍රදේශයේද විවිධ රාජ්‍ය සමග අපේ සම්බන්ධතා තිබී ඇත. විශේෂයෙන්ම ථෙරවාද බුද්ධදහම ආන්ද්‍ර ප්‍රදේශයේ ප්‍රචලිත වීම හේතුකොටගෙන ඒ ප්‍රදේශය සමග විශේෂිත සංස්කෘතික සම්බන්ධතා තිබී ඇති බව පෙනී යයි. එයටත් කලකට පෙර අශෝක රජුගේ මෞර්ය රාජ්‍යය සමග අපේ සංස්කෘතික සම්බන්ධතා තිබී ඇත. අශෝක රජුටත් පෙර ක්‍රි. පූ. නවවැනි සියවසේ පමණ සිට දඹදිව නැගෙනහිර ප්‍රදේශයෙන් අර්ධ වෛදිකයන් ලෙස අප විසින් හැඳින්වෙන පිරිසක් ලංකාවට සංක්‍රමණිකයන් ලෙස පැමිණ ඇති බව ඉතිහාසයෙන් පෙනී යයි. තවත් සුළු පිරිසක් බටහිර පෙදෙස්වලින්ද සංක්‍රමණය වී ඇත. මේ සියලු දේශපාලනික හා සංස්කෘතික සම්බන්ධතා මැද අපි අපේ අනන්‍යතාව රැකගත්තෙමු. ඉන් අදහස් කරන්නේ අප වෙනස් නොවූ බව නොවේ. අනන්‍යතාව, සංස්කෘතිය ආදිය රැකෙන්නේම වෙනස්වීම හේතුවෙනි. එහෙත් ඒ වෙනස්වීම අපට අවශ්‍ය ආකාරයට සිදුවන්නේ නමය. අප වෙනස්වන්නේ අන්‍යයනට අවශ්‍ය අන්දමට නම් අපට අපේ අනන්‍යතාව රැකගැනීමට නොහැකි වනු ඇත.

ආර්යයන් භාරතයට පැමිණීමට පෙර අපේ කලාපයේ, දළ වශයෙන් ගතහොත් අද සාර්ක් කලාපය යැයි හැඳින්වෙන ප්‍රදේශයේ, තිබු සංස්කෘතිය යම් ප්‍රමාණයකට හෝ තවමත් දැකගත හැක්කේ ථෙරවාදී බෞද්ධයන් අතර බව මගේ විශ්වාසය වෙයි. ඒ සඳහා ප්‍රවාද හා සාධක (සාධක යනු ප්‍රවාදවලින් ස්වායත්ත වූ දෑ නොවේ. බටහිර විද්‍යාවේ දර්ශනය බටහිරයන්ගෙන් ඉගෙන ඒ සම්බන්ධයෙන් පූර්ව පොපර් මත දරණ ඇතැමුන්ට ඒ ප්‍රශ්නයක් විය හැකි වුවත් සිංහල බෞද්ධයන්ට නම් එහි කිසිදු ප්‍රශ්නයක් නැත. ඉංගිරිසි ෆැක්ට්ස් යන වචනයට සිංහලෙන් වචනයක් පවා නැත. සාධක යන්න ඒ සඳහා වාත්තුකරගත් වචනයකි. ප්‍රවාද වෙනස්වන විට ඊනියා සාධක ද වෙනස් වන බව බටහිරින්ම දැනගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා තොමස් කුන්ගේ හා පෝල් ෆෙයරාබන්ඩ්ගේ පොතපත කියවිය හැකිය.) ඇති නමුත් තවමත් ඒ බව නිගමනයක් ලෙස ප්‍රකාශ කිරීමට නොහැකිය. සිදුහත් කුමරු උපන්නේ දඹදිව ඊසාන යැයි කිවහැකි ප්‍රදේශයෙහිය. වයඹින් දඹදිවට පැමිණි ආර්යයෝ එහි සිටි අනාර්යයන් (අනාර්ය යනු ද්‍රවිඩ නොවේ.) පාලනය කරමින් ඔවුන්ගේද සංස්කෘතියෙන් ඇතැම් දේ ගනිමින් වෛදික සංස්කෘතිය නිර්මාණය කළහ. මේ සංස්කෘතිය දඹදිව නැගෙනහිරට ගලාගියේ හෙමින්ය. නැගෙනහිර හා ඊසානදිග වැසියන් වෛදිකකරණයට එතරම් භාජනය නොවූ බැවින් සිදුහත් කුමරු උපන් කාලයේදීද එයට පෙරද ඒ පෙදෙස්වල ජීවත් වූවන් අර්ධ වෛදිකයන් ලෙස හැඳින්විය හැකිය. අප රටට සංක්‍රමණය වූ ඊනියා ආර්යයෝ මේ අර්ධ වෛදිකයෝ වූහ. ඔවුන් එතරම් වෛදික සංස්කෘතියට හසුනොවී තිබුණු බැවින් මෙරට එකලද බ්‍රාහ්මණ ආධිපත්‍යයක් නොවීය. පණ්ඩුකාභය කුමරුන්ට ඉගැන්වූ පණ්ඩුල බ්‍රාහ්මණයා වුවද සමාජයේ එතරම් ආධිපත්‍යයක් දරා නැති බව පෙනී යයි. මේ සංස්කෘතික වෙනස්වීම් රෙඩ්ෆීල්ඩ්ගේ මහා සම්ප්‍රදාය චූල සම්ප්‍රදාය ප්‍රවාදය ඇසුරෙන් තේරුම්ගත නොහැකිය. භාරතයට පැමිණි ආර්යයන්ට ප්‍රාග් වෛදික භාරතීය සංස්කෘතියද යම් ප්‍රමාණයකට හෝ අවශෝෂණය කරගැනීමට සිදු විය. රෙඩ්ෆීල්ඩ්ගේ මහා සම්ප්‍රදායේ හා චූල සම්ප්‍රදායේ අරමුණ බටහිර සංස්කෘතික ආක්‍රමණය යුක්ති යුක්ත කිරීම බව පැහැදිලිය.

© Prof. Nalin De Silva

අපේ බොහෝ ප්‍රබුද්ධයෝ අවිචාරයෙන් මේ සංකල්ප හා ප්‍රවාද යොදාගනිති. මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය යන්න යොදාගැනීමට පෙර අඩුම තරමින් රෙඩ්ෆීල්ඩ් කියා ඇත්තේ කුමක්දැයි අවබෝධකරගැනීමට ප්‍රබුද්ධයන් ඔහුගේ මුල්කෘති කියවා උත්සාහකරන්නේ නම් මැනවි.

බුදු දහම ලෞකික වශයෙන් ගත් කල වෛදික සංස්කෘතියට හා බ්‍රාහ්මණ ආධිපත්‍යයට එරෙහිව පැනනැගුණක් ලෙසද සැලකිය හැකිය. බුදු දහම නිල වශයෙන් ලංකාවට ලැබීමත් සමඟ මෙරට සංස්කෘතියෙහි වෛදික ලක්ෂණ සුළුවෙන් හෝ තිබී නම් ඒ තවත් දුර්වල විය. එබැවින් සිංහල සංස්කෘතියෙහි බමුණු මත හා වෛදික ලක්ෂණ ඇත්තේ අඩු ප්‍රමාණයකින්ය. අපේ සංස්කෘතියෙහි තවමත් ඇතැම් ප්‍රාග් වෛදික ලක්ෂණ ඇත. එහෙත් භාරතයට සිදු වුයේ කුමක් ද? වෛදික ලක්ෂණ හා බමුණු මත ක්‍රමයෙන් එහි නැගෙනහිර දිශාවෙහිද ප්‍රචලිත විය. දඹදිව බෞද්ධ සංස්කෘතියට මේ වෛදික ප්‍රහාරයට මුහුණ දීමට තරම් ශක්තියක් නැති විය. එයට එක් හේතුවක් වුයේ ඒ සංස්කෘතික ප්‍රහාරය රාජ්‍ය බලය, එනම් දේශපාලන බලය, සමඟ අත්වැල් බැඳගැනීමය. තවද බුදු සසුනට රිංගූ බමුණෝ බුදු දහම ද ඔවුන්ට සරිලන ආකාරයට වෙනස්කළහ. එහි ප්‍රතිඵලය වුයේ මහායාන බුද්ධාගමය. එහෙත් ඒ පවා දඹදිවින් නැති වී ගියේය. එයට එක් හේතුවක් වුයේ මුස්ලිම් ආක්‍රමණයය. ප්‍රධාන හේතුව බමුණු මතවලට බමුණු තර්කනයෙන් හා න්‍යායයෙන් පිළිතුරු දීමට ගොස් මහායාන බෞද්ධයන්ද අවසානයේදී ආත්මවාදීන් වී බමුණන්ට යටවීමය. එහෙත් ලංකාවේ එසේ නොවීය. බුදු දහම බිහි වු සංස්කෘතියෙහි අංග වැඩි ප්‍රමාණයක් ලංකාවේ දේවානම් පියතිස්ස සමයෙහි පැවතියේය. එසේ නොවු සංදර්භයකදී බෞද්ධ සංස්කෘතිය ලංකාවට ගැලෙපන අයුරින් සකස්කරගන්නා ලදී. බෝධි වන්දනාව එයට උදාහරණයකි. මෙවැනි කරුණු නිසා ලංකාවේ බුදු දහම මුල් ඇල්ලුයේය. එමෙන්ම පසුකලෙක හෝ බමුණන් ශක්තිමත් නුවු බැවින් ඔවුන්ට බුදු සසුන තුළට රිංගා ඒ ඔවුන්ට අවශ්‍ය ආකාරයට සකස්කිරීමට අවකාශයක් නොවීය. ලංකාවේ ථෙරවාදී සම්ප්‍රදාය නොනැසී රැකුණා පමණක් නොවේ. ලංකාව ලෝක ථෙරවාදයෙහි මධ්‍යස්ථානය බවට පත්විය. බුදුදහම ලංකාවේ මුල් අල්ලා පැතිරගියේ ඇතැම් අනුකාරකයන් සිතන අයුරින් බුදුදහමට රාජ්‍ය බලය ලැබුණු නිසා නොව මෙරට සංස්කෘතිය ථෙරවාදයට තෝතැන්නක් වීම නිසා හා මහාවිහාරික භික්ෂුන් වහන්සේගේ දුර දක්නා නුවණ නිසාය. පසු කලෙක ආන්ද්‍ර ප්‍රදේශයෙහි ථෙරවාදය නැති වීමෙන් පසුත් ලංකාවෙන් ථෙරවාදය අතුරුදන් නොවීය. භාරතයේ වැඩි ප්‍රමාණයක් හින්දු බවට (හින්දු ආගම ඇතිවුයේ වෛදික ආගම්, බුදු දහම හා ජෛන දහම සංකලනයෙන් බවට සාක්ෂි වෙයි.) පත්වීමෙන් කලකට පසුව මුස්ලිම් ආක්‍රමණයෙන් භාරතයේ ඇතැම් ප්‍රදේශවල ජනයා ඉස්ලාම් ආගම වැළඳගත්හ. ලංකාව මේ කිසිවකින් වෙනස් නොවිණි. ඇතැමුන් කීමට තැත්කරන්නේ පෘතුගීසීන් නොඑන්නට ලංකාව මුස්ලිම් වන්නට තිබුණු බවය. එහෙත් එය වැරදිය. අග්නිදිග ආසියාව හා බෙංගාලයේ කොටසක් මුස්ලිම් වීමෙන් පසුව ද ලංකාව මුස්ලිම් නොවිණි. අනෙක් අතට පෘතුගීසීන්ට හා ඉන්පසු ලන්දේසීන්ට හා බ්‍රිතානීන්ට රාජ්‍ය බලය තිබියදීත් මුහුදුබඩ සිංහලයන්ගෙන් කතෝලික හෝ ක්‍රිස්තියානි වුයේ ඉතා අඩු ප්‍රතිශතයකි. බුදුහම පැතුරුණේ රාජ්‍ය බලය නිසා යැයි මොරදෙන්නන් මේ සම්බන්ධයෙන් කියන්නේ කුමක්ද?

කෙසේ වෙතත් කෙතරම් බලසම්පන්න වුවත් භාරතයට අවශ්‍ය ආකාරයට ලංකාව මෙහෙයවීමට ඉතිහාසයේ නොහැකි වී ඇත. ඉංසීරිගින්ගේ සටකපට දේශපාලනය එන තෙක් ලංකාව නිවහල් රටක් විය. අපට වැරදුනේ ඉංගිරිසින් සමඟ හැප්පීමට අපේ දැනුමක් හා එහිම කොටසක් වු රාජ්‍ය තන්ත්‍රයක් නොතිබු බැවින්ය. අදත් අප සොල්භයිම්ලාට යටවන්නේ එබැවිනි. අපි එය ජයගනිමු. ඒ අතර ඉන්දියාව නටන්නට සූදානම්වන නැටුම ගැනද අපි විමසිල්ලෙන් සිටිමු. අවුරුදු දහස් ගණනක් අප නටවන්නට බැරි වු කේන්ද්‍රීය ඉන්දියාවට ඇත. එදා බටහිරින් පැමිණි ආර්යයන්ට යට වු භාරතය තම අනාර්ය සංස්කෘතිය වෙනුවට වෛදික සංස්කෘතිය වැළඳ ගත්තේය. අපි එසේ නොකළෙමු. මෙහි කලින් සඳහන් කළ ආකාරයට අපේ කලාපයේ පැරණි අනාර්ය (ද්‍රවිඩ නොව, ද්‍රවිඩයන් ඉන්දියාවට පැමිණියේ ක්‍රි. පූ. හයවන සියවසේ යැයි නිලඛණ්ඨ ශාස්ත්‍රී ආදී ඉතිහාසඥයෝ පවසති.) සංස්කෘතිය යම් ප්‍රමාණයකට හෝ අප සතුවෙයි. අද ඉන්දියාව සූදානම්වන්නේ දෙවැනි වරටත් බටහිර සංස්කෘතික ආක්‍රමණයකට ගොදුරුවන්නටය. අද ඉන්දියාව හා ඇමෙරිකා එක්සත් ජනපද අතර ඇත්තේ දැඩි සම්බන්ධයකි. කොකාකෝලා මැක්ඩොනල්ඩ් සංස්කෘතිය අද ඉන්දියාවේ පැතිර යයි. ඉන්දියාවේ ඊනියා දියුණුව සමඟ දෙවැනි වෛදිකකරණයක් (ඇමරිකාඉන්ද්‍රකරණයක්) සිදුවෙමින් පවතියි. ඉන්දියාවට එයට මුහුණදීමට ශක්තියක් නැත. අද ඉන්දියාව මේ කලාපයෙහි ඉටුකරන්නේ බටහිරයන්ට අවශ්‍යදේය. බටහිරයෝ ඉන්දියාව ලවා ඉක්මනින් බලය බෙදීමට අපට බලකරති. ඉන්දියාවේ විදේශ ඇමැති ලංකාවට පැමිණ අපට ඉක්මන්වීමට යැයි කියා ආපසු යන්නේ තදියමකිනි. අපට එවැනි තදියමක් නැත. අප

උත්සාහ ගන්නේ අපට ආවේණික ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමටය. අවශ්‍ය නම් අපි බලය ගැන නවතම අර්ථකථනයක් කරන්නෙමු. අපට අපේ සංස්කෘතියෙහි මහඔෂධලා සිටිති. අපට වෛදික කෞටිල්‍යයන් අනවශ්‍යය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva